


# කට්ටිය පොඩ්ඩක් නැවතිලා කවියක් විඳිමුද?

**මෙම කවිය විප්‍රයෝගය පිළිබඳ ප්‍රබල හැඟීම් ජනනය කරන අපූර්ව කවියකි. එහෙත් එය වට්ටෝරුගත පරිකල්පනයක් නොවේ. සුලභ භාෂා ප්‍රයෝග එහි නැත. කවියා ගොඩ නගා ඇති බස ඉතා සරල කටවහරට මදක් සමීප නිහතමානී බසකි. එහෙත් ඉන් මවන දෘෂ්‍ය රූප හා අර්ථ ධ්වනිය විප්‍රයෝගය පිළිබඳ මෙතෙක් නොලද කම්පනයකට අප කැඳවාගෙන යනු ලබයි. අලුත් රිදුමක් ඇති කොට අලුතින් සිතන්නට අප යොමුකොට තිබේ.**

රැස් කරගත් පොත්පත් ටික කැන්ගරු දේශයට ගොඩ බැස්සේය. අතරමං වී සිටි දරුවකුට සිය මවගේ දසුන ප්‍රිය වන්නේ යම් සේද මට එය එපමණටම ප්‍රිය දසුනක් විය. ඉන්ද්‍රජාලික බවින් ව්‍යාකූලව ගිය බහු භාණ්ඩික සමාජයේ මානසික ව්‍යාධියට පොත පත කියැවීම එක්තරා සහනයක් බව මම විශ්වාස කරමි. අති ලෞකික අරමුණු නිර්වින්දන එන්නතක් සේ ශරීරගතකොට ඇති මොහොතක හොඳ කවියක්, ගීතයක්, නව කතාවක්, සිනමාපටයක් තුළින් ලද හැකි ප්‍රති ජීවය සුළුපටු නොවේ.

මෙතෙරට පැමිණි පොත පත අතර මට "කණිකා" මුණගැසිනි. එය අරියවංශ රණවීර කවියාගේ කවි පොතකි. අද ඔවුහු හුදකලාව කවි ලියමින් සිටිති. එම කවි ජාතියේ රසවින්දනයට අවශෝෂණය වන මං ඇහිරී තිබේ. මිලියන විස්සකට අධික ජනගහණයක් වෙසෙන රටක කවි පොත් දහසක් අලවි කර ගැනීම අසීරු ඉලක්කයක් වීම ජාතික අධ්‍යාපනයේ තරම කියාපාන්නකි. පුවත්පත් බැලූ විට කවි ලියන්නට වෙර දරන පිරිස ගණනින් දහස ඉක්මවා සොයා ගත හැකිය.

යටත් පිරිසෙන් ඔවුන්වත් කවි පොතක් මිලදීගෙන රස විඳීමේ පුරුද්දක් ඇතිකොට ගෙන සිටින්නේ නම් කවි පොත් දහසක් අලවි කර ගැනීම අසීරු ඉලක්කයක් විය නොහැකිය. එහෙත් ඔවුන්ද නව කවි පරිශීලනය කරන බවක් නොපෙනේ. අද දවසේ පුවත්පත් කවි පිටුවල ප්‍රමිතිය ගෙන බැලූ විට නොකියවන පරපුරක නිසරු වූ කවි ලකුණු හඳුනාගැනීම දුෂ්කර නොවේ. පුවත්පතක නම පලවීමේ සතුට පමණක් ඔවුන් භුක්තිවිඳින සෙයකි. එක රැයින් කවියකු විය හැකි නොවේ. එය දිගු අභ්‍යාස කාලයක අනර්ග පලයකි.

කවිය රසවිඳුමට ශාස්ත්‍රීය මග පෙන්වීමක් සපයන විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ කියැවීම්, හැදෑරීම්ද ඉහත තත්වයට දෙවැනි නොවේ. බොහෝ දෙනෙකුගේ කවිය පිළිබඳ දැනුම 80 දශකයෙන් මෙපිටට පැමිණ නැත. ඊට උදාහරණ සපයන එක් අත්දැකීමක් මගේ මතකයට නගාගත හැකිය. මා කොළඹ සරසවි සිසුවකු ලෙස සාහිත්‍ය විෂය හදාරන අවධියේ (1998 - 2001) මෙය සිදුවිය. නූතන කවියේ ප්‍රවනතා පිළිබඳව ලියන්නට සාහිත්‍ය විචාර විෂය තුලින් අපට පැවරුණි. මම එම නිබන්ධනය සඳහා ආසන්න වර්ෂ කිහිපයකම රාජ්‍ය සම්මාන දිනා ගත් කාව්‍ය කෘති වලින් උදාහරණ සපයා ගතිමි. එහෙත් එම නිබන්ධනයට මා අපේක්ෂිත ලකුණු නොලැබුණෙන් එම නිබන්ධනය ඇගයීම කළ කථිකාචාරිනිය හමු වී ඒ පිළිබඳව විමසා සිටියේය. ඇය සඳහන් කළේ එහි මා සපයා තිබූ උදාහරණ නූතන කවියේ නව ප්‍රවණතා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් නොවන බවයි. එවිට මා උදාහරණ සපයා ගත් කාව්‍ය කෘති මොනවාදැයි ඇයට පැහැදිලි කර දුනිමි. එහෙත් ඇය ඒ වන විට එම කෘති කියවා තිබුණේ නැත. එම කවි පොත් කියා නොතිබුණු ඇය නූතන කවියේ නව ප්‍රවණතා කෙසේ දනී ද ? නූතන කවියේ නව ප්‍රවණතා ලෙස ඇය 70-80 දශකවල උදාහරණ අපේක්ෂා කළා විය හැකිය. ඉදින් ඔවුන්ගේ දේශන වලට පමණක් සවන් දී සාහිත්‍ය විචාරය ඉගෙන ගන්නා සිසුනට දෙවියන්ගේම පිහිට මිස අන් කවර පිහිටක් ලද හැකි ද?

"කණිකා" කාව්‍ය සංග්‍රහය ගැන කතාව අතුරු මගක ගියේය. සැබැවින්ම මට ඕනෑ කළේ අපූර්ව කවියක රසය ඔබ හා බෙදා හදා ගැනීමටයි. තනියෙන් රස විඳිය හැකි සීමාවක් තිබේ. එය ඉක්මවා ගිය පසු එම රසය නොපවසා සිටිය නොහැකිය. මෙම කවිය හමුවේ මා පත්ව ඇත්තේ එම තත්ත්වයටයි.

මෙම කවිය "පේර ගසට" යන නමින් නම්කොට තිබේ. මෙම සටහන කියවන්නට පෙර දැඩි ඉවසීමකින් මෙම කවිය කිහිපවරක් කියවනු මැනවි. පෙලින් පෙර දිවයින එහි රිද්මය ස්පර්ශ කරනු මැනවි.

**පේර ගසට**

**ඇය නොමැත**
**නිවස**

**නො අසන්න**
**මන්දැයි**

**දෙක**
**තුනක්**
**පේර පල**
**විලිකුන්ව**
**අතු මත**
**බලා ඉන්නා**
**බව**
**දනිමි**

**ඇය පැමිණ**
**එවක**
**ඉස්සී**
**දික් සිහින්**
**පා ඇඟිලි**
**මතින්**
**දක්වා**
**රත් විලුම්**
**නවාලා**
**අතු**
**නෙලාගෙන**
**ඉදුණු පල**
**දුන්නා**
**මා අතට**
**සතුටට**
**දෙක**
**තුනක්**
**නො නෙලා**
**ඉතිරි කර**
**ඇයිදැයි**
**ඇසූ විට**
**"ඒ**
**කුරුල්ලන්ට"**

**කීවා**
**ඈ**
**නෙත් කොනින්**
**සිනාසී**
**බලාලා**
**මා මුහුණ**
**එකවර**

**අපුලයි**
**මට**
**ඔබ පල**
**ඇය නැතුව**
**දෙන්න**
**ඒ සියල්ල**
**කුරුල්ලන්ට**

**දනිමි**
**මම**
**ඇය සතුටු වේවි**
**ඒ**
**වැඩ පිළිවෙලට**
**කොහේ හෝ සිට**

මෙම කවිය විප්‍රයෝගය පිළිබඳ ප්‍රබල හැඟීම් ජනනය කරන අපූර්ව කවියකි. එහෙත් එය වට්ටෝරුගත පරිකල්පනයක් නොවේ. සුලභ භාෂා ප්‍රයෝග එහි නැත. කවියා ගොඩ නගා ඇති බස ඉතා සරල කටවහරට මදක් සමීප නිහතමානී බසකි. එහෙත් ඉන් මවන දෘෂ්‍ය රූප හා අර්ථ ධ්වනිය විප්‍රයෝගය පිළිබඳ මෙතෙක් නොලද කම්පනයකට අප කැඳවාගෙන යනු ලබයි. අලුත් රිදුමක් ඇති කොට අලුතින් සිතන්නට අප යොමුකොට තිබේ.

"ඇය නොමැත
නිවස
නො අසන්න
මන්දැයි"

ඇගේ නික්මයාම පිළිබඳ හේතු ප්‍රත්‍ය විවරණයට හෝ එහි සාවද්‍ය නිරවද්‍යතාව පහදන්නට කවියා ඉදිරිපත් නොවේ. එමෙන්ම ඔහු ශෝක ප්‍රකාශනයටද වචන වියදම් නොකරයි. ඔහු ඒ වෙනුවට අපට පල විලිකුන්ව ගිය පේර ගසක් මුණගස්වා ඒ හා බැඳි අතීත කථාවක් වෙත අපගේ කල්පනාව කැඳවාගෙන යයි. ඔහු ඒ සඳහා නිරූපිත බස අපූර්ව ප්‍රාණයකින් හා චිත්තරූපී බවකින් අනූන කරයි.

විලිකුන් පල සහිත පේර ගසට සජීවී බව ආරූඪ කර ඇති සැටි බලන්න.

"දෙක
තුනක්
පේර පල
විලිකුන්ව
අතු මත
බලන ඉන්නා
බව
දනිමි"

"පේර අතු මත බලා ඉන්නවා" යන්න කෙතරම් අපූර්ව යෙදුමක්ද ? ඒ කා සඳහාද ? සැබැවින්ම මේ බලා ඉන්නේ පේර ගහමද ?

ඇය එවක පැමිණ පේර නෙලා තමාට දුන් අයුරු චිත්‍රනය කරන භාෂාව විශ්මිත චලන රූපයක් සේ ඉදිරිපත් කරන අයුරු බලන්න.

"ඉස්සී
දික් සිහින්
පා ඇඟිලි
මතින්
දක්වා
රත් විලුම්
නවාලා
අතු"

වචන කැඩීමේදී මතුවන රිද්මයත් ප්‍රකාශිත අර්ථයත් අතර ඇති අවියෝජනීය සම්බන්ධය විශ්මිතය. එමෙන්ම එහි සඟවා ඉදිරිපත් කරන ශෘංගාරය හා සුකුමාර බව අපට මුණගස්වන්නේ සුරූපී තරුණියකි. "රත් විලුම්, දික් සිහින් ඇඟිලි" යන යෙදුම් චාරු ලියකගේ රූප ස්වභාවය ඉදිරිපත් කරන්නට ඉතා ප්‍රමාණවත් වී තිබේ. අද නැත්තේ එවන් ලියකි. එබැවින් විප්‍රයෝගය තව තවත් තීව්‍ර වේ.

දෙක
තුනක්
නෙලාලා
ඉතිරි කර
ඇයිදැයි
ඇසූ විට
"ඒ
කුරුල්ලන්ට"

ඇය තමා සමඟ පෙමින් විසූ කල ඇය මහත් අභිරුචියෙන් සිදු කළ ක්‍රියාවත් කවියා අපගේ අවධානයට නතු කරයි. එම අතීත ක්‍රියාවන් පිලිකුන්ව බලා සිටින පේර පලත් එකිනෙකට මුණගස්වා අප ප්‍රබල කම්පනයකට හසුකරග නී. අවසානයේ කවියා එය එම කම්පනය විදුලි අකුණක් සේ එකවර ප්‍රබල ශක්තියකින් මුදාහරින අයුරු බලන්න.

"අපුලයි
මට
ඔබ එල
ඇය නැතිව
දෙන්න
ඒ සියල්ල
කුරුල්ලන්ට

දනිමි
මම
ඇය සතුටු වේවි
ඒ
වැඩ පිළිවෙලට
කොහේ හෝ සිට"

මා තවත් කිසිවක් කිය යුතු නැතැයි සිතමි. කිව හැකිද නොවේ මන්ද කවියා මහා කම්පනයක් මුදා හල ඒ පරිකල්පනය වචනයෙන් විස්තර කිරීම නිරර්ථ ක බැවිනි.

බොහෝ කවීන් අත සුසුම් පද ගොඩක් බවට පත්වන මෙම අත්දැකීම රණවීර කවියා අත විශ්මිත නිමැවුමක් වූ අයුරු විශිෂ්ඨ කවි කමක මහිමය මිස අනෙකක් නොවේ. එය කවියට පෙම් බැඳි අප රස මනස සනසාලයි.

රවී සිරිවර්ධන
ravi.siriwardhaí@gmail.com

ඔබේ සොඳුරු මංගල දිනයේ



ඔබේ සොඳුරු මංගල දිනයේ
අපේ සම්ප්‍රදායික රටාවෙන් හා
නවීන විලාසිතාවෙන්
පිරිපුන් මනාලියක දක්වා හැඩ වීමට

මනාලියන්ගේ මල් කළඹ සැකසීම

ඔබේ සියලුම රූපලාවන්‍ය කටයුතු
එකම තැනකදී පහසු මිලකට

- කාන්තා කොණ්ඩා කැපීම හා කොණ්ඩා මෝස්තර
- පර්ම් කිරීම ස්ට්‍රේට් කිරීම කලර් කිරීම
- ටින්ට් කිරීම රිබොන්ඩිං කිරීම
- ෆේෂල් කිරීම වැක්ස් කිරීම
- ත්‍රෙඩින් කිරීම මුහුණ බ්ලීච් කිරීම සම බ්ලීච් කිරීම ඇතුලු සියලුම රූපලාවන්‍ය කටයුතු සඳහා

දස වසරක පළපුරුද්ද සමගින්
උසස් ඩිප්ලෝමාධාරිණී

**ප්‍රෂානි සුරවීර**
*Salon Colour Box*
14 Winterton Close
Epping
**TP 9401 3727 / 0425 805 754**